**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**

**--------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4`** **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**----------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| **ඡේද යොමුව** | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** |
|---|---|---|
| **--------** | **-----------------------** | **-----------** |
| **1.6.1 (ඈ)** | ආයතනයේ ගිණුම් වාර්තා කිරීමේ පදනම යටතේ බලකා ව්‍යාපෘති තුළ පවත්වා ගෙන යනු ලබන දිගු කාලීන භෝග වගාවන්හි වටිනාකම්, මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ තුළ අදාල වටිනාකම් නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයිති බිම් කැබලි 51 ක, ගොඩනැගිලි 113 ක සහ අක්කර 1,360 ක ස්ථිර භෝගයන්ට අදාල ගස් 48,470 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වත්කම් තක්සේරු කර, ගිණුම් ගත කිරිමට උපදෙස් ලබාදී ඇති බව. | මෙම වත්කම් ලේඛනගත කර ගිණුම්ගත කළයුතු විම සහ වටිනාකම් විගණනයට අනාවරණය කළයුතු වීම. |
| (ආ) | ස්ථාවර වත්කම් වර්ග 4 කට අදාලව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අවසාන ශේෂවල එකතුව රු. මිලියන 962.3 ක් වුවද, එම වත්කම්වල භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව අවසාන ශේෂවල එකතුව රු. මිලියන 945.1 ක් වූයෙන්, රු. මිලියන 17.2 ක වෙනසක් පැවතුණි. තවද, කාර්යාල උපකරණ මිලදී ගැනිම් ලෙස භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල රු. මිලියන 27.33 ක් දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු. මිලියන 15.79 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.මිලියන 11.54 ක වෙනසක් පැවතුණි. | අදාල වෙනස්කම් භාණ්ඩාගාර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර නිරවුල් කර ගැනිමට උපදෙස් ලබා දි ඇති බව. | වෙනස්කම් හඳුනාගෙන ශේෂයන් සමාන කර ගැනීමට කටයුතු කළයුතු වීම. |

### 1.6.2 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරනු ලබන වර්ග අඩි 91,349 ක සහ වර්ග මීටර් 2,380 ක ගොඩනැගිලි 85 ක් හා වගා කටයුතු, තාවකාලික ඉදිකිරීම් සහ වෙනත් අවශ්‍යතා සඳහා පරිහරණය කරන හෙක්ටයාර් 214 කට අදාල බිම් කැබලි 66 ක අයිතිය පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොකෙරුණි. | අදාල ගොඩනැගිලි හා බිම් කැබලිවල අයිතිය තහවුරු කර කඩිනමින් වාර්තාවක් ලබා දිමට කටයුතු කරන බව. | අදාල බිම් කැබලි සහ ගොඩනැගිලි වල අයිතිය තහවුරු කෙරෙන ලේඛන විගණනයට ඉදිරිපත් කළයුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස අනාවරණය කර ඇති රු. මිලියන 37 ක් වටිනා වත්කම් සනාථ කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | මූල්‍ය නොවන වත්කම්වල ශේෂ සම්බන්ධව පරීක්ෂා කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරමින් පවතින බව. | ශේෂ අතර වෙනස්කම් හඳුනා ගැනීමටත්, ගිණුම්ගතකර ඇති වත්කම් වලට අදාල වටිනාකම් විගණනයට ලබා දීමටත් කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, පුනරාවර්තන වැය විෂයන් 17 ක් සඳහා එකතුව රු බිලියන.7.2 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. බිලියන 1.3 ක ප්‍රතිපාදනද, මූලධන වැය විෂයන් 07 ක් සඳහා වූ එකතුව රු. මිලියන 202.36 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 109.66 ක ප්‍රතිපාදනද උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරි කිරීම් ප්‍රමාණය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 77 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.තවද, අංක 320-01-01-1203 දරන වැය විෂයෙන් රු. මිලියන 80 ක් අංක 320-01-01-2509 දරන වැය විෂයට මාරුකර ගෙන තිබුණු අතර, මෙසේ මාරු කර ගත් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 58.56 ක් හෙවත් සියයට 73 ක් වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. | වර්ෂය අවසානයේදි අක් මුදල් නොලැබිමත්, පැවති කොරෝනා තත්වය මත භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන සීමා විමත් මත ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළයුතු වීම. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මු.රෙ 94(1) හා 214 රෙගුලාසි නොසලකා කටයුතු කිරීම නිසා වර්ෂ අවසානයේදී තෙවන පාර්ශවයන් වෙත ගෙවීමට තිබුණු බැරකම් වටිනාකම රු. මිලියන 269.4 ක් වී තිබුණු අතර, එම වටිනාකම තුළ මසකට වැඩි බැරකම් විෂයයන් 417 ක වටිනාකම රු.මිලියන 175.9 ක් විය. | කොරෝනා තත්වය නිසා භාණ්ඩ හා සේවා සැපයීම ප්‍රමාද වීමෙන් මෙම තත්ත්වය හටගෙන ඇති බව. | බැරකම් කඩිනමින් බේරුම් කිරීමට කටයුතු කළයුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ.94(2) හා (3) යටතට නොගැනෙන වැය විෂයන් තුනක එකතුව රු. මිලියන 43.5 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර තිබුණි. | 2021 වර්ෂයේ සිට මෙම වැය ශිර්ෂයන් බැරකම් ලේඛනයෙන් ඉවත් කිරිමට කටයුතු කරන බව. | මු.රෙ හෙළිදරව් කළයුතු බැරකම් පමණක් අනාවරණය කළයුතු වීම. |
| (ඇ) | රාජ්‍ය ආයතනයකට හා පුද්ගලික ආයතන 13 කට ගෙවිය යුතු එකතුව රු.මිලියන 113.2 ක බැරකම් ශේෂයන් සනාථ කර නොතිබුණි. | අදාල ආයතන වෙත දැනුම් දීම් සිදුකර ඇති අතර, එම ලිපිවල පිටපත් ඔබ වෙත ඉදිරිපත් කර ඇති බව. | බැරකම් ශේෂ සනාථකර එවන ලෙස අදාල ආයතන දැනුම්වත් කළ යුතු වීම. |

## 2.3 වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තුවක් විසින් අංක 284-1-1-8-2105 වැය විෂයට වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් රු.මිලියන 2.5 ක් හෙවත් සියයට 32 ක් වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. | භාණ්ඩ සපයා ගැනිමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කළයුතු වීම. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය හැරගොස් ඇති නිලධාරින් 76 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 10.5 ක අපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණු අතර,මෙම ණය ශේෂ වර්ෂ තුන ඉක්මවා තිබුණි. | අදාල ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගතයුතු වීම. |
| (ආ) | රජයේ නිලධාරින්ට අත්තිකාරම් "බී" ගිණුම සමඟ ඉදිරිපත් කළ අංක 02 සිට 05 දක්වා ආකෘතිපත්‍රවලට ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ අත්සන් කර නොතිබුණි. | ඉදිරියේදී සියලු ඇමුණුම් ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ අත්සනින් ඉදිරිපත් කරන බව. | අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය පරිදි ගිණුම් ඉදිරිපත් කළයුතු වීම. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත් දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුමක් සඳහා 2020 නොවැම්බර් මාසයේ සිට 2021 මැයි මාසය දක්වා වූ මාසික බැංකු සැසඳුම් විස්තර 2021 ජුනි මාසය දක්වා බොහෝ ප්‍රමාද කර පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි. | කොරෝනා තත්ත්වය මත මූලස්ථානය මාස කිහිපක් වසා තැබීමෙන් මෙම ප්‍රමාදය සිදුවී ඇති බව. | මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කළයුතු විම. |
| (ආ) | යථෝක්ත බැංකු ගිණුමේ එකතුව රු. මිලියන 21.4 ක් වටිනා චෙක්පත් 102 ක් නිකුත්කර මාස 06 ඉක්මවීමෙන් පසුවද, බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, එම චෙක්පත් සම්බන්ධයෙන් මු.රේ 396(ඇ) පරිදි කටයුතු කර නොතිබුණි. | මාස 06 ඉක්මවූ චෙක්පත් සම්බන්ධව මු.රෙ 396 (ඇ) ප්‍රකාරව කටයුතු කිරිමට උපදෙස් ලබාදුන් බව. | කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු විම. |
| (ඇ) | යථෝක්ත බැංකු ගිණුමේ මාස දෙකේ සිට මාස දොලහක කාල පරිච්ඡේදයක සිට පවතින හඳුනා නොගත් තැන්පත් කිරීම්වල සහ හඳුනා නොගත් ගෙවීම්වල වටිනාකම පිළිවෙලින් රු. මිලියන 15.79 ක් හා රු. 145,979 ක් වූ අතර, මෙම ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂ හඳුනා ගැනිමට උපදෙස් ලබා දි ඇති බව. | මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |

**2.6 අග්‍රිම ලබාගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 20,289.6 ක අග්‍රිම ඉල්ලුම්කර තිබුණද, ලැබී තිබුණු මුළු අග්‍රිම වටිනාකම රු.මිලියන 16,347.2 ක් වුයෙන් රු.මිලියන 3,942.4 ක් හෙවත් සියයට 19 ක ප්‍රමාණයක් ලැබී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අක්මුදල් අවශ්‍යතාවය මහා භාණ්ඩාගාරයට කල්වෙලා ඇතිව ඉදිරිපත් කර අක්මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **මෝටර්රථ ප්‍රවාහන පනත** | දෙපාර්තුමේන්තුව පරිහරණය කරනු ලබන මෝටර් රථ 26 ක් හා යතුරුපැදි 28 ක් රජයේ ආදායම් බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ධාවන කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි. | අදාල වාහන සඳහා කඩිනමින් ආදායම් බලපත්‍ර ලබා ගැනිමට උපදෙස් ලබා දි ඇති බව. | ධාවන කටයුතු සඳහා යොදවාගනු ලබන වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතු වීම. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 103 (1) (ආ) | 2019 හා 2020 වර්ෂවල සිදුවී තිබුණු වාහන අනතුරු 26 කට අදාල අලාභහානි සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර නොතිබුණු අතර, අලාභහානි වටිනාකමද, තක්සේරු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මෙම තත්වය වළක්වා ගැනිම සඳහා කටයුතු කරන බව. | රිය අනතුරු වලින් වාහන වලට සිදුවන අලාභහානි සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කළයුතු වීම. |
| (ii) මුදල් රෙගුලාසි 104 (3),(4) | 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් සිදුවී තිබුණු වාහන අනතුරු 26 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සහ පරිපූර්ණ වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මෙම තත්වය වළක්වා ගැනිමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා සහ පරිපූර්ණ වාර්තා සකස්කර ඉදිරිපත් කළයුතු වීම. |
| (iii) මුදල් රෙගුලාසි 110 | දෙපාර්තමේන්තුව විසින් පසුගිය වර්ෂ 05 ක කාලය තුළම අලාභ හානි වාර්තා කිරීමට හානි ලේඛනය පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ සිට හානිපාඩු ලේඛණය යාවත්කාලිනව නඩත්තු කිරිමට කටයුතු කරනු ලබන බව. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරවකටයුතු කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) මුදල් රෙගුලාසි 770(4) හා 770 (අ) (ආ) | 2020 වර්ෂයට පෙර ධාවනයෙන් ඉවත් කර ඇති වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව එම වාහන මේවන විට කාණ්ඩ ගත කර තිබෙන අතර, කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරන බව. | ධාවනයට ආයෝග්‍ය බවට තීරණය කර ඇති වාහන සම්බන්ධයෙන් යථෝක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| | (v) මුදල් රෙගුලාසි 880 හා 891 | දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 10 ක සහ ද්විතීක තනතුරු 03 ක නිලධාරීන් ඇප තබා නොතිබුණු අතර, ඇප ලේඛනයක්ද පවත්වා නොතිබුණි. | ඇප තැබීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව. | ඇප තැබිය යුතු නිලධාරීන් අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීමටත් ඇප ලේඛනයක් පවත්වා ගැනීමටත් කටයුතු කළයුතු වීම. |
| | (vi) මුදල් රෙගුලාසි 1645 | දෙපාර්තුමේන්තුව පරිහරණය කරනු ලබන වාහන 324 ක් සඳහා ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. | සියළුම වාහන සඳහා ඉදිරියේදී ලොග් පොත් පවත්වා ගැනිමට කටයුතු කරන බව. | වාහනය සඳහා ලොග් සටහන් පොත් පවත්වාගත යුතු වීම. |
| | (vii) මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුව පරිහරණය කරන වාහන 554 ක් සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මු.රෙ 1646 අනුව කටයුතු කරනු ලබන බව. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඉදිරිපත් කළයුතු වීම. |
| | (viii) මුදල් රෙගුලාසි 1647(ඉ) | දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන ගිය වාහන ලේඛනයේ එක් එක් වාහනය භාර දුන් දිනය හෝ පැවරු දිනය සඳහන් කොට නොතිබුණි. | උක්ත තොරතුරු වාහන ලේඛනයට ඇතුලත් කිරීමට කඩිනමින් පියවර ගන්නා බව. | අදාල විස්තර ඇතුළත් කර වාහන ලේඛනය පවත්වා ගතයුතු වීම. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 554 කට අදාලව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | මෙම වර්ෂයේදි ඉන්ධන පරික්ෂාව සම්පුර්ණ කිරිමට කටයුතු කරනු ලබන බව. | යථෝක්ත චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කර ඉන්ධන පරික්ෂාවන් සිදු කර ඒ මත ධාවන සටහන් තුළනය කිරීමට කටයුතු කළයුතු වීම. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මන්නාරම කොණ්ඩච්චි ප්‍රදේශයේ අක්කර 1,200 ක පමණ (කජු ගස් 45,000 කට ආසන්න) කජු වගා ව්‍යාපෘතියක් දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යනු ලබන අතර, පසුගිය වර්ෂ 4 ක ආදායම හා වියදම සැසඳීමේදී රු.මිලියන 12.6 ක ආදායම ඉක්මවූ වියදමක් පැවතුණි. තවද මේ සඳහා යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින් 262 දෙනෙකුගේ වැටුප් වියදම සැලකිල්ලට ගත් විට ව්‍යාපෘතියේ අලාභය තව දුරටත් ඉහළ යන බව නිරීක්ෂණය විය. වන අලි තර්ජනය නිසා ආරක්ෂාවට පමණක් භටයින් 186 දෙනෙකු යොදවා තිබුණු අතර, කජු ගස් අංක කර ලේඛන ගතකර නොතිබුණි. තවද, කජු ඵලදාව නෙලීම හා ලේඛනගත කිරීම විධිමත් අධීක්ෂණයකින් තොරව සිදු කරන අතර, කජු අස්වැන්න ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් ද සපයා නොතිබුණි. | ඉදිරියේදී භූමිය වටා අලිවැටක් ඉදිකිරීමටත්, කජු ගස් අංක කිරීමටත්,අස්වනු නෙලීම නිසි ලෙස අධීක්ෂණය කිරීමටත්, ප්‍රමාණවත් ගබඩා පහසුකම් ලබා දීමටත් කටයුතු කරන බව. | වගාව, අස්වනු නෙලීම හා ගබඩා කිරීම නිසි ලෙස කළමනාකරණය කරමින් වියදම් අවම කර අපේක්ෂිත ප්‍රථිලාභ ලබා ගැනිමට කටයුතු කළයුතු වීම. |

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව පවත්වාගත යුතු සැලසුම් සකස්කිරීමට උපදෙස් ලබා දි ඇති බව. | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 4.2.1 මාර්ගෝපදේශයන් පරිදි ප්‍රසම්පාදන සැලසුම් සකස්කළ යුතු වීම. |
| (ආ) අක්බෝපුර ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති සිමෙන්ති ගල් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා රු. 798,445 ක අමු ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කර නොතිබුණු අතර, සිමෙන්ති, ගල් අලෙවියෙන් ඉපයූ රු. මිලියන 1.1 ක ආදායම්, දින ගණනාවක්ම අත රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී ප්‍රාදේශියව මිල ගණන් කැඳවා ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය මිලදි ගැනිමට කටයුතු කරන බව හා අලෙවියෙන් ලැබි ඇති සියළුම මුදල් මේ වන විට බැරකර ඇති බව. | මිලදී ගැනීම්වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කළ යුතු වීම හා විකුණුම් ආදායම් ප්‍රමාදයකින් තොරව බැංකු ගත කළයුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරක්ෂක අමාත්‍යාංශයට අයිති වාහන 13 ක් හා යතුරුපැදි 19 ක්, ජනාධිපති කාර්යාලයට අයත් වාහන 6 ක්, අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අයත් වාහන 4 ක් සහ තවත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අයත් වාහන 10 ක් දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින අතර, මෙම වාහන වල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් පවරා ගත් වාහන වල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනිමට මේ වන විට ක්‍රියාකරමින් පවතින බව. | අදාල වාහනවල නිත්‍යානුකූල අයිතිය කඩිනමින් පවරාගත යුතු වීම. |
| (ආ) | කොණ්ඩච්චි කජු වගා භූමියේ කජු කපන යන්ත්‍ර දෙකක් හා මිලිමීටර් 12 ප්‍රමාණයේ වානේ කම්බි 132 ක් 2017 වර්ෂයේ සිට ඌණ උපයෝජිතව පැවතිණි. | අදාල යන්ත්‍ර උපයෝජනය කිරිම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරිමටත්, වානේ කම්බි 132 වෙනත් ඉදිකිරිම් කටයුත්තකට ලබාදිමටත්, කටයුතු කරන බව. | ඌණ උපයෝජිත වත්කම් වලින් ඵලදායි ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතු විම. |
| (ඇ) | විගණනය සිදුකළ නියැදි පරීක්ෂාවකට අනුව දෙපාර්තමේන්තුවට අයිති වාහන 11 ක් අලුත්වැඩියාවන් සඳහා පුද්ගලික ගරාජ වෙත ගෙන ගොස් තිබුණද, වසර එකේ සිට තුන දක්වා කාල පරාසයක් මේ වන විට ගත වී ඇතත්, අදාල වාහන වල අලුත්වැඩියා අවසන් කර දෙපාර්තමේන්තුවට භාරදී නොතිබුණි. දීර්ඝ කාලයක් පුද්ගලික ගරාජ තුළ නවතා තැබීමෙන් වාහනවල අමතර කොටස් හා විවිධ උපාංග නැතිවීමටත්, අව්වෙන් හා වැස්සෙන් සිදුවන හානි සිදුවීමත් සහ දීර්ඝ කාලයක් ධාවනයෙන් ඉවත් කිරීම නිසා වාහනවල හොඳ තත්ත්වයේ පවතින සක්‍රීය කොටස් නිරායාසයෙන් අක්‍රීය වීමත්, සිදුවන බව නිරික්ෂණය විය. | අළුත්වැඩියා කිරිම ප්‍රමාද වී ඇති වාහන කඩිනමින් අළුත්වැඩියා කර ලබා ගැනිමටත්, වාහන අළුත්වැඩියා ප්‍රගති සමාලෝචන රැස්විම් සෑම මාසයකට වරක්ම පැවැත්විමටත් උපදෙස් ලබා දි ඇති බව. | වාහන අලුත්වැඩියාවන් ඉක්මනින් සහ කාර්යක්ෂමව සිදුකළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ වත්කම් නිසි ලෙස කළමනාකරණය කරමින් ආරක්ෂාකර ගැනිම සඳහා කටයුතු කළයුතු විම. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පාපැදියට, ඇම්ප්ලිෆයර් කට්ටලයකට හා ත්‍රිකුණාමලය බලකා මූලස්ථානයේ ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල ගිනි ගැනීම හේතුවෙන් සිදු වූ රු. 342,320 ක අලාභහානි සහ වාහන 26 කට රිය අනතුරු වලින් සිදු වූ අලාභහානි මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි. මෙයින් වාහන 10 කට සිදු වූ අලාභය රු. 141,359 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණු අතර, ඉතිරි වාහන 16 සම්බන්ධයෙන් අලාභ ගණනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කිරීමටත්, එම අලාභ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමටත්, උපදෙස් ලබා දී ඇති බව. | වත්කම්වලට සිදු වූ අලාභහානි මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළයුතු වීම. |

## 3.5 නොවිසඳී ඇති විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු භෞතික සම්පත්, මානව සම්පත් සහ අභ්‍යන්තර අරමුදල් උපයෝගී කර ගනිමින් බලකායන් 22 ක් සහ පුහුණු පාසල් 05 ක් මගින් විවිධ ස්වරූපයේ ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යන නමුත් දෙපාර්තමේන්තුව තම දැක්ම, මෙහෙවර හා කාර්යයන් යටතේ එවැනි ව්‍යාපෘති පවත්වා ගෙන යාමක් හඳුනාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | දෙපාර්තමේන්තුව තම දැක්ම, මෙහෙවර හා කාර්යයන් වර්තමාන අවශ්‍යතාවයන් හා ක්‍රියාකාරකම්වලට අනුව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මහඔය බලකායේ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ගඩොල් 782,326 ක ඌනතාවයක් නිසා සිදුවී තිබුණු අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් පියවා ගැනීමට විමර්ශන මණ්ඩලය විසින් 2018 ජූලි 03 වන දින නිර්දේශ කර තිබුණු නමුත් අලාභය අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අලාභහානි අය කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වීම. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තුව වෙනත් ආයතන හා පුද්ගලයින්ට අයිති රූඩ් 51 කට අයත් බිම් කැබලි 12 ක් හා වර්ග අඩි 34,286 කට අදාලව ගොඩනැගිලි 42 ක් දීර්ඝ කාලයක සිට පරිහරණය කරන අතර, මෙම ඉඩම් හා ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වෙනත් ආයතන හා පුද්ගලයින්ට අයත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව ලේඛන පරික්ෂා කර ඉදිරි කටයුතු සිදුකිරීමට පියවර ගන්නා බව. | වෙනත් ආයතන වලට අයත් ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා වියදම් දැරිය යුතු නිසා මේවායේ නිත්‍යානුකුල අයිතිය පවරා ගැනිමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව කාර්යාල පවත්වා ගැනීම, නිල නිවාස හා වාසස්ථාන පහසුකම් හා ගබඩා පහසුකම් සපයා ගැනීම වැනි ගොඩනැගිලි අවශ්‍යතා පිළිබඳව දිගු කාලීන සැලස්මක් අනුව කටයුතු නොකිරීම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල විවිධ ආයතන හා පුද්ගලයින්ට අයිති වර්ග අඩි 130,769 ක් හා වර්ග මීටර් 2,000 කට අදාළ ගොඩනැගිලි 128 ක් තාවකාලිකව පරිහරණය කිරීමට සිදු වී තිබුණි. ඇතැම් ගොඩනැගිලි පරිශ්‍ර දෙපාර්තමේන්තු වියදමින් නවීකරණ කටයුතුද සිදු කර තිබුණි. | මෙම ගොඩනැගිලිවල අවශ්‍යතාවයන් සමාලෝචනය කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි අවශ්‍යතාවය හඳුනාගෙන දිගු කාලීන සැලැස්මක් මඟින් ගොඩනැගිලි අවශ්‍යතා සම්පූර්ණ කළයුතු වීම. |
| (ඇ) | නිසි ලෙස අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව සිවිල් ආරක්ෂක බලකා භට පිරිස් සඳහා 2016 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. මිලියන 4.7 ක් වටිනා නිල ඇඳුම් හා නිල ඇඳුම් රෙදි සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගබඩාවල ඉතිරි වී තිබුණු අතර, මේ වනවිට මෙම තොගවල සම්මත ප්‍රමිති තත්ත්වයන්ට හානි සිදු වී තිබුණි. තවද, කටුනායක බලකා මූලස්ථානයේ නිල ඇඳුම් ගබඩාවේ වර්ෂ 02 කට අධික කාලයක සිට නිකුත් නොවී පවතින රු.620,740 ක් වටිනා නිල ඇඳුම් හා ඒ ආශ්‍රිත විවිධ ද්‍රව්‍ය වර්ග 14 ක අයිතම 968 ක තොග පැවතුණි. | මෙම ඉතිරි තොග සම්බන්ධව කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදීගැනිම් සිදුකළ යුතු වීම සහ සෙමින් චලනය වන තොග ආර්ථික ප්‍රතිලාභ සැලසෙන පරිදි උපයෝජනය කළයුතු වීම. |
| (ඈ) | කටුනායක බලකා මූලස්ථානය මගින් එම ප්‍රදේශයේ අක්කර 10.5 ක පතෝල සහ අන්නාසි වගා කිරීමේ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර තිබූ අතර, අදාල වගා කටයුතු සඳහා සහභාගී වූ 13 දෙනෙකු සඳහා එකතුව රු.3,862,800 ක වැටුප් පිරිවැයක් දරා තිබුණද, ලබා තිබුණු ආදායම රු.978,370 ක් වී තිබුණි.මෙම ව්‍යාපෘති දිස්ත්‍රික් නියාමක විසින් නිසි අධීක්ෂණයක් කර ලේඛන පවත්වා ගැනීමක්ද කර නොතිබුණි. | මේ වනවිට මෙම කෘෂි ව්‍යාපෘති දෙක අවසන් කර ඇති අතර සියළුම බලකා අධික්ෂණ නිලධාරින්ට, අධික්ෂණය සම්බන්ධව හා පවත්වා ගත යුතු පොත්පත් සම්බන්ධව මාර්ගෝපදේශයක් ලබා දි ඇති බව. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, පිරිවැය ඵලදායිතාවය පිළිබඳව සලකා බැලිය යුතු වීම සහ ලේඛන පවත්වා ගනිමින් නිසි අධික්ෂණයක් සිදු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සේවා වනිතා සංගමය විසින් දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ දරුවන්ට අභ්‍යාස පොත් නිෂ්පාදනය කර බෙදා හැරීම සඳහා කන්තලේ බලකායේ හටයින් 239 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 12 දින සිට දෙසැම්බර් 28 දින දක්වා යොදවා ගෙන තිබුණු අතර, මෙම කාල පරිච්ඡේදය තුළ අදාල හටයින් සඳහා රු.මිලියන 45.1 ක වැටුප් පිරිවැයක් දරා තිබුණද, එම මුදල දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි. | 2021 වසරේදි අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරිම වෙනුවට විවෘත වෙළඳපලින් මිලදි ගැනිම කෙරෙහි අවධානය යොමුකර ඒ සඳහා කමිටුවක් පත්කර ඇති බව. | අදාල වැටුප් පිරිවැය දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කළයුතු විම. |

4. **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ------------ |
| (අ) | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් හා තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 54 ක් ඇතුළු සමස්ථ පුරප්පාඩු 4,786 ක් පැවතුණි. | අදාල පුරප්පාඩු පිරවිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිමට කටයුතු කළයුතු විම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලයේ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 33,111 දෙනෙකුට කිසිදු පුහුණුවක් ලබා දී නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පාඨමාලා සංවිධානය කිරීමට නොහැකි වූ බව. | සේවක පුහුණුව තුලින් කාර්යසාධනය ඉහල නංවා ගැනිමට කටයුතු කළයුතු විම. |